Library 2024.09

Learning Resource Center
R
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## 10 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2024

කතෝලික ධර්මය I, II

පැය තුනයි

## කතෝලික ධර්මය I

**උපදෙස්:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති අංක (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංක සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(1) දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරන ලද සම්ප්‍රදාය කුමක් ද?
i) යාවේ ii) ලිඛිත iii) වාචික iv) පූජක

(2) කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය වන ශුද්ධ බයිබලයේ අඩංගු පොත් සංඛ්‍යාව
i) 46 කි ii) 70 කි iii) 72 කි iv) 73 කි

(3) පැරණි ගිවිසුමේ ඉතිහාස පොත් ..................කි.
i) 16 ii) 12 iii) 7 iv) 14

(4) "මේ පොතේ ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින් ඉදිරියේ සිදු කළ සේක." මෙය සඳහන් කරන ක්‍රිස්තු ශ්‍රාවකයා වන්නේ,
i) ශු. පේදුරු තුමා ii) ශු. ජොහන් තුමා
iii) ශු. ජාකොබ් තුමා iv) ශු. පාවුළු තුමා

(5) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
i) ශු. මාක් තුමා ii) ශු. ලූක් තුමා
iii) ශු. මතෙව් තුමා iv) ශු. පාවුළු තුමා

(6) ශුද්ධ බයිබලය ලේඛනගතව ඇති බවට සාමාන්‍ය පිළිගැනෙන කාලය වන්නේ,
i) ක්‍රි.ව. 100 - ක්‍රි.ව. 900 ii) ක්‍රි.ව. 950 - ක්‍රි.ව. 100
iii) ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100 iv) ක්‍රි.පූ. 700 - ක්‍රි.පූ. 100

(7) අපෝස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයෙකි.

i) ශු. පාවුළු තුමා ii) ශු. ලූක් තුමා iii) ශු. ස්තේපන් තුමා iv) ශු. මාක් තුමා

(8) නව ගිවිසුමේ සංදේශ අතරින් ශුද්ධ වූ පාවුළු තුමා කර්තෘ නොවන සංදේශය වන්නේ,

i) රෝම ii) පිලමොන් iii) හේබ්‍රෙව් iv) තීතස්

(9) ශුද්ධ වූ පාවුලු තුමා සිරගතව සිටිය දී ක්‍රිස්තු භක්තිකයින්ගේ විශ්වාසය ස්ථිරව සිටින ලෙස දන්වා ලියන ලද ලිපිය නම්,

i) පිලිප්පි ii) පිලමොන් iii) රෝම iv) එපීස

(10) දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය වන්නේ,

i) ජපමාලය ii) ශුද්ධ බයිබලය iii) කුරුසිය iv) නෝවා

(11) පීඩන යුගයක සතුරන්ගේ තර්ජනවලට ලක්වූ සැදැහැවතුන් දිරිගැන්වීමට ප්‍රයත්න දරා ඇති පොත,

i) ද්විතීය නීති සංග්‍රහය ii) තෝබිත් iii) 1 මකබි iv) දානියෙල්

(12) අප ජීවිතයෙහි හමුවන බාධක ගැටලුවලට ඉවසීමෙන් මුහුණදිය හැකි නම් අවසානයේ ස්වර්ගීය සැපත ලබා ගත හැකි බව අපට මතක් කරනුයේ,

i) ද්විත්ව වාදය යි . ii) යුගාන්තවාදය යි.

iii) සංකේත භාවිත යි. iv) ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම යි .

(13) එළිදරව් සාහිත්‍යයේ සංඛ්‍යා සංකේත අතර අංක "10"න් සංකේතවත් කරන්නේ,

i) පරිපූර්ණත්වය යි. ii) පූර්ණත්වය යි.

iii) මරණය යි. iv) විශ්වය යි.

(14) සලමොන් රජතුමා දෙවියන් වහන්සේට දවන යාග පූජා දහසක් පුද කළ ස්ථානය වන්නේ,

i) මොරියා ii) සීනායි ය. iii) ගිබියොන් iv) සියොන්

(15) ජීවිත හරය, එහි ගැටලු හා විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහය වන්නේ,

i) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව යි

ii) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව යි.

iii) රාජ්‍ය සභා ප්‍රඥාව යි.

iv) අභිධාර්මික ප්‍රඥාව යි.

(16) කෙනෙකු එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථා පිළිබඳව උපදේශන ඇතුළත් වන බයිබලීය ග්‍රන්ථය වන්නේ,

i) ජෝබ් ය. ii) ධර්මදේශකයා ය.

iii) හිතෝපදේශ ය. iv) සිරාක් ය.

2024-09

(17) ජුදයින් අතට පාවා දීමෙන් අනතුරුව ජේසුස් වහන්සේව පළමුව රැගෙන ගියේ,

i) පිලාත් ඉදිරියට ය ii) ප්‍රෙතෝරියම් වෙතට ය

iii) හෙරොද් ඉදිරියට ය iv) උත්තම පූජකයාගේ මැඳුර වෙතට ය

(18) ජේසුස් වහන්සේගේ කර පිට තැබූ කුරුසිය උසුලාගෙන යාමට සහය වූයේ,

i) සිරේනියේ සීමොන් ය. ii) සීමොන් පේදුරු ය.

iii) රෝම සොල්දාදුවෙක් ය. iv) නිකදේමුස් ය.

(19) ජේසුස් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය වූයේ,

i) මරිය තුමිය ය ii) මග්දලාහි මරියා ය

iii) එලිසබෙත් තුමිය ය iv) වෙරෝනිකා ය

(20) ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට පව් කමා කිරීමේ බලය දානය කළේ ........... හවසය.

i) ගොබ් ඉරිදා ii) පාස්කු ඉරිදා

iii) පෙන්තකොස්ත දින iv) මහ සිකුරාදා දින

(21) **පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.**

A - අහස විවර වීම

B - හිරු අඳුරු වීම

C - සැඩ සුළඟක් හැමීම

D - රට පුරා අන්ධකාරය ඇති වීම

ඉහත සිද්ධීන්වලින් ක්‍රිස්තුන් වහන්සේ උකුත් වූ අවස්ථාවේ දී සිදු වූ පාරිසරික වෙනස්කම් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,

i) A හා B ii) B හා C iii) C හා D iv) B හා D

(22) ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා භූමදාන කටයුතු සිදු කිරීමට ඉදිරිපත් වන්නේ,

i) අරමාතියේ ජෝසෙප් ය ii) බර්ණබස්ය

iii) සිරේනියේ සීමොන් ය iv) මග්දලාහි මරියා

(23) ''මම ඇල්ෆා හා ඔමේගා ය. පළමුවැන්නා හා අන්තිමයා ය'' යනුවෙන් සඳහන් ග්‍රන්ථය වන්නේ,

i) එළිදරව්ව ii) උත්පත්ති iii) ජෝබ් iv) දානියෙල්

(24) "INRI" යන්නෙහි අර්ථය වන්නේ,

i) "ජුදයන්ගේ රජ සැරදේවා" ii) "ජේසුස් වහන්සේ රජ නුඹ ය"

iii) "ජේසු නසරේනු ජුදයින්ගේ රජ" iv) "රජුන්ගෙත් රජ "

Learning Resource Center
R
De Mazenod College
Kandana

(25) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම අගමනය පිළිබඳව සඳහන් වන්නේ,

i) අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ ය. ii) පැරණි ගිවිසුමෙහි ය.

iii) ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපිවල ය . iv) මාක් සුබාරංචියේ ය.

(26) පාස්කු මංගල්‍යය සැමරීමට ජුදෙව්වෝ ගියේ,

i) ගලීලට ය. ii) නාසරතයට ය.

iii) මිසරයට ය. iv) ජෙරුසලම් දේව මාලිගයට ය.

(27) හෙරෝද් (අග්‍රිපා 1) විසින් හිස ගසා මරා දමන ලද්දේ,

i) ශුද්ධ වූ පේදුරු තුමාව ය ii) ශුද්ධ වූ මහා ජාකොබ් තුමාව ය

iii) ශුද්ධ වූ ස්තේපන් තුමාව ය iv) ශුද්ධ වූ ලූක් තුමාව ය

(28) උපස්ථායකයකු පමණක් නොව සුබ අස්න දේශනා කළ, පුද්ගල චරිතය වන්නේ,

i) ස්තේපන් තුමා . ii) මතියස් තුමා.

iii) මාක් තුමා. iv) ගමාලියෙල් තුමා.

(29) ක්‍රිස්තුස් වහන්සේ පාවුලු තුමාගේ ජීවිතය වෙනසකට ලක් කළේ,

i) කොරින්තියේ දීය ii) ජෙරුසලමේදීය

iii) දමස්කස් හි දීය iv) අන්තියෝකියේ දීය

(30) පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදු කරන ලද්දේ,

i) ජෙරුසලමේදී ය ii) ජෙරිකෝවේදී ය

iii) පිලිප්පි කයිසාරියේදී ය iv) අන්තියෝකියේදී ය

(31) ".............. පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්තය" මෙහි හිස්තැනට යෝග්‍ය වචනය වන්නේ,

i) ජොහන්ගේ ii) ජෝසප්ගේ iii) ජොනතන්ගේ iv) ජෝනාගේ

(32) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා අයත් නිකාය වන්නේ,

i) දිව්‍ය සත්ප්‍රසාද නිකාය ii) නිර්මල මරිය නිකාය

iii) ෆ්‍රැන්සිස්කන් නිකාය iv) ජේසු නිකාය

(33) ශුද්ධ වූ සභාවේ එකමුතුකමේ පදනම වන්නේ,

i) ශුද්ධ වූ ත්‍රිත්වය ii) ශුද්ධ වූ පවුල

iii) ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය iv) සකල ජනතාව

2024-09 G-10

(34) ශුද්ධ වූ සභාව තුළ දිස්වන අනිවාර්ය ලක්ෂණයක් නොවන්නේ,

i) ඒකත්වය ii) සාධාරණත්වය iii) සැනසීමය iv) ශුද්ධත්වය

(35) පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වන්නේ,

i) දොමිනිකාන ධර්මදූතවරු ii) ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු

iii) ජේසු නිකායික ධර්මදූතවරු iv) අගුස්තීනු නිකායික ධර්මදූතවරු

(36) ලංකාව තුළ කැමති ආගමක් ඇදහීමේ නිදහස උදා වූයේ,

i) බ්‍රිතාන්‍ය යුගයේ දී ය ii) පෘතුගීසි යුගයේ දී ය

iii) නිදහසින් පසු යුගයේ දී ය iv) ලන්දේසි යුගයේ දී ය

(37) සුභාරංචි කතුවරුන් හතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්යය වන්නේ,

i) වතුර මිදි යුෂ බවට හැර වීම යි ii) ලාදුරු රෝගීන් දස දෙනා සුව කිරීම යි

iii) පූප වැඩි කිරීම යි iv) මාරුත දමනය යි

(38) පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - විශ්ව ලේඛන 14ක් රචනා කිරීම

B - 1907 කොන්වෙන්ෂුවල් ප්‍රැන්සිස්කානු නිකායට ඇතුළු වීම

C - පැරිස් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ධුරය දැරීම

D - බලාපොරොත්තුවේ එළිපත්ත කෘතිය රචනා කිරීම

ඉහත කරුණු ඇසුරින් දෙවන ජුවාම් පාප් වහන්සේ පිළිබඳ දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.

i) A හා D ii) B හා C iii) C හා D iv) A හා C

(39) දෙවිමවුන්ගේ ආදරය ලොව පුරා පැතිර වීමට ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා විසින් ආරම්භ කළ සඟරාව වන්නේ,

i) "අයුක්තියට පිළිතුර" ii) "සත්‍යය"

iii) "ලෝක සාමය" iv) "වීර සෙබලා"

(40) දිව්‍ය පූජාව සිදු කරමින් සිටිය දී සහසිකයකුගේ වෙඩි පහරින් අප අතරින් සමුගත් පියතුමා වන්නේ,

i) ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ii) ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

iii) ගරු ගොන්සාල්වෙස් පියතුමා iv) ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි) පියතුමා

***

Learning Resource Center
R
De Mazenod College
Kandana

REGISTRAR
De Mazenod College
Kandana.

# මීගමුව අධ්‍යාපන කලාපය

## 10 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2024

## කතෝලික ධර්මය II

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) i) ශුද්ධ බයිබලයෙහි ප්‍රධාන කර්තෘ හා උපකාරක කර්තෘ නම් කරන්න.

ii) ශුද්ධ වූ පාවුළු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.

iii) ශුද්ධ වූ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියවී ඇති කෘති දෙක නම් කරන්න.

iv) උපස්ථායකයින් පත් කිරීමේ දී සලකා බැලූ කරුණු දෙක කුමක්ද?

v) කෝට්ටේ රාජ්‍යය පෘතුගීසි පාලනයට නතුවීමත් සමග මෙරට සේවය සඳහා පැමිණි වෙනත් පැවිදි නිකායන්ට අයත් ධර්මදූත නිකායන් දෙකක් නම් කරන්න.

vi) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

vii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වන ආකාර දෙක කුමක්ද?

viii) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා පත් කළ ගිහි නායකයින් දෙදෙනකු නම් කරන්න.

ix) ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් ග්‍රන්ථාරූඪ කරන ලද පොත් දෙකක් නම් ලියන්න.

x) තෙරේසා මව්තුමිය හඳුන්වනු ලබන විරුදාවලි දෙකක් ලියන්න.

(02) i) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

ii) ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප තුනක් නම් කරන්න.

iii) පාපයට ඇලී ගැලී සිටින ඔබගේ මිතුරෙකු පාපයෙන් බේරා ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග

(03) i) ජේසුස් වහන්සේ හෙරෝද් විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු නොදුන් විට හෙරෝද් කළ ක්‍රියාවන් දෙකක් ලියන්න.

ii) ජේසුස් වහන්සේ උත්ථානයෙන් පසු දර්ශනය වූ අවස්ථා තුනක් නම් කරන්න.

iii) ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස ඔබ පාසල තුළ ක්‍රියා කරන ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න.

REGISTRAR
De Mazenod College
Kandana.

(04) i) මුල් කිතුනු සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

ii) පෙන්තකොස්ත දිනයේ පේදුරු තුමා ජෙරුසලම් චතුරස්‍රයේ දී කළ කථාවෙන් ප්‍රකාශ වූ වැදගත් කරුණු තුනක් සඳහන් කරන්න.

iii) ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගැනීමට අවශ්‍ය ශුද්ධාත්ම වරම් ඉල්ලා දෙව්පියාණන්ට යාච්ඤාවක් ලියන්න.

(05) i) මහ බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

ii) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු තුනක් ලියන්න.

iii) ඉරුදින දිව්‍ය පූජාවට අර්ථාන්විතව හා ක්‍රියාකාරීව සහභාගිවීම සඳහා ඔබ ගන්නා පියවර කරුණු පහකින් විස්තර කරන්න.

(06) i) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.

ii) ඉශ්‍රායෙල් ජනයා මිසරයේ කළ කර්මාන්ත තුනක් නම් කරන්න.

iii) තෙවන පනතට විරුද්ධ ක්‍රියා පහක් කෙටියෙන් විස්තර ලියන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i) ශුද්ධ වූ පාවුලු තුමාගෙන් සිදු වූ සේවය

ii) "මව්පියන්ට සංග්‍රහ කරව" දේව පනත

iii) ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා

iv) පෙන්තකොස්ත මංගල්‍යය

***

REGISTRAR
De Mazenod College
Kandana.